# හැඳින්වීම

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වියළි හා තෙත් දේශගුණික ලක්ෂණ දෙකකට අයත් පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාශයේ පිහිටා ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙක අතරින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වශයෙන් මෙම කොට්ඨාශය හැදින්විය හැකිය. පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාශය පොදුවේ තෙත් දේශගුණයෙන් යුත්ත වන කොට්ඨාශයක් වශයෙන් හැදින්විය හැකි වුවත් , පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තෙත් දේශගණයක් සහිත කොට්ඨාශයක් වශයෙන්ද තෙත් හා අර්ධ වියළි දේශගුණයෙන් යුත් අනෙක් ප්‍රදේශය වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වශයෙන්ද හැදින්වේ.

වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය විශාලත්වය වර්ග කිලෝමීටර් 96.256 ක් ද අක්කර අනුව බලන විට අක්කර 24064.07(හෙක්ටයාර් 9625.63) කින්ද යුත්තය. මෙහි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 38 කින් අන්තර්ගත වන අතර ගම්මාන වශයෙන් ගත්විට ගම්මාන 113 ක් ඇත. මුළු ජනගහනය 37717කි. පවුල් සංඛ්‍යාව 11822කි. 99.4% ක බහුතර සිංහල ජනතාවක් ජීවත්වන මෙම කොට්ඨාශය තුළ අන්‍ය ජාතීන් සුළු පිරිසක් ජීවත් වේ. ආගමික වශයෙන් ගත්විට 97.9% ක බෞද්ධ ජනතාවක් ජීවත් වන බව සංඛ්‍යා ලේඛණ අනුව පැහැදිළි වේ. මහජනාධාර ලබන පවුල් සංඛ්‍යාව 4308 ක් වේ.(කොට්ඨාශය තුළ සියළුම ආධාර ලබන්නන්)

සමස්ථයක් ලෙස ගත්කල තැනිතලා භූමි ප්‍රදේශයකින් යුක්ත වුවද තැනින් තැන පොළව මට්ටමින් උඩට නැගුන ශේෂ කඳු වැටි කිහිපයක්ද දක්නට ඇත. ස්වභාවික සම්පත් ලෙස කළු ගල් හා මැටි කර්මාන්තය සඳහා සුදුසු මැටිද මෙම ප්‍රදේශයේ දක්නට ඇත. කළුගල් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පුරාම ව්‍යාප්තව ඇති බව විශේෂයෙන් දක්නට ඇති අතර ඒ නිසාම ඒ හා බැදුණු කර්මාන්ත සඳහා යොමුවීමේ ප්‍රවනතාවයකුත්, ඒ ආශ්‍රිත පරිසර ගැටළු සමූහයකුත්, ප්‍රමාණවත් පානීය ජල අවශ්‍යතා ලබාගැනීමේ ගැටළු ද වර්ධනයවී ඇති බව ඉදිරිපත් වන ජනතා අවශ්‍යතා හා ගැටළුවලදී මනාව පැහැදිලිවේ.

කෘෂිකර්මය පදනම් කර ගත් ආර්ථික රටාවක් මෙම ප්‍රදේශයේ ඇති අතර පොල් හා වී ප්‍රධාන වැවිලි බෝග වේ. වැව් 20 හා අමුණු 29 ක් පදනම් කර ගනිමින් කෘෂිකාර්මික කටයුතුවල නියලුනද වර්ෂාපතනය, කෘෂිකර්මාන්තය සඳහා ප්‍රධානම ජලය සපයන ජල මූලාශ්‍රය බවට පත්වී ඇත. දකුණු උතුරු දිශාගතව ගලා බස්නා කොළමුණු ඔය හා මගුරු ඔය මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ආවරණය කරමින් ගලා බස්නා ප්‍රධාන ජල මූලාශ්‍රයන් දෙකය. දේශගුණික තත්වය සැලකීමේදී සෙල්සියස් අංශක 31.8ක වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වයක් හා මිලිමීටර් 211.5ක වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනයක් ද මෙම කොට්ඨාශය තුළ 2021 වර්ෂයේදී දක්නට ලැබිණි.

# පිහිටීම

වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරිපාලන සීමා මායිම් වශයෙන් උතුරට බමුණාකොටුව හා මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් ද දකුණට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද නැගෙනහිරට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද බටහිරට නාරම්මල හා කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද මායිම්ව පිහිටා ඇත. (සිතියම් අංක 01)

පිහිටීම අනුව සලකා බැලීමේදී උතුරට අවසාන ගම් පිඹුරු අනුව අංක 2605 වදුරුස්සේගම ගම් මායිම් පනාගමුව හා කළුදැලිය පොදු ගම් මායිම් ඔස්සේ නැගෙනහිරට අංක 1222 පනාගමුව , 1210 ඊතනවත්ත , 1219 දම්පිටිය , 1204 දිවුල්ගස්පිටිය, යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවල දකුණු මායිම් ඔස්සේ මීටර් 14750 ක් පමණ නැගෙනහිරට මගුරු ඔය මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ඇති රේඛාවද නැගෙනහිරට ඇදි රේඛා ලක්ෂ්‍යය සිට දකුණු දිශාවට අංක 219 ඒ බමුණාවල සිට 220 රත්ගල්ල ගම් මායිම් බටහිර මායිම් දිගේ දකුණු දිශාවට පැමිණෙන බඩහැද්දර ගම්මානය එකතුවන ලක්ෂ්‍යද දකුණට ඉහත කී ලක්ෂ්‍යයේ සිට බඩහැද්දර ගම්මානයේ දකුණු මායිම් දිගේ බඹරගහපැළැස්ස බටහිර ගම්මානය හමුවන ලක්ෂ්‍යය දක්වා පැමිණ එතැන් සිට බස්නාහිර දිශාවට වදාකඩ , හානාගම , යටිහේන , නිල්වත්තේගම , දෙමටගෙදර , කෙසෙල්වත්තේහේන , ගින්නෝරිය යන ගම්වල උතුරු මායිම් දිගේ බටහිරට උඩුකහ සහ රුකවපත්තු කෝරළේ මායිම් හමුවන ලක්ෂ්‍යයද වේ. බස්නාහිරට ඉහතකී උඩුකහ හා රුකව පත්තුකෝරළේ මායිම් හමුවන ලක්ෂ්‍යද වේ. බස්නාහිරට ඉහතකී උඩුකහ හා රුකව පත්තු කෝරළේ මායිම් හමුවූ ලක්ෂ්‍යයේ සිට 286 කරගහලප්පල , 293 මීවැව , ගනේගොඩ , 280 කරගහගෙදර , 379 ඉහළ පොතුහැර යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවල නැගෙනහිර මායිම් ඔස්සේ වයඹ කෝණ ලක්ෂ්‍යයන් ද මායිම් වේ.